**<u>දෙමාපිය පැතුමන්.......</u>**

සීතල රජයන රෑ යාමේ - සෙවනැලි නොසැලෙන නිසංසලේ

සිත තුල උපදින -ගී පද තනු වී

හිමිහිට මුමුනන්නේ - හදවත සැනසෙන්නේ//

අප දිනු මේලොව - අභිමිව යනලොව

අප තනිවී ඉන්නේ - දූදරු සිහිවන්නේ //

නෙතු යුග පියවෙනවා - අඳුරක මැදිවෙනවා

පුතු හෙට ඒදැයි - හීනෙන් විමසනවා

සීතල රජයන රෑ යාමේ ......

මව් දින පිය දින - යලි යලි එනතුරු

දින ගනිමින් ඉන්නේ - සිතුවිලි බොඳවන්නේ //

එනවද මගෙ පුතුනේ - ආදර දියණියනේ //

සමුගෙන යන්න අපෙන් - නෙතු පියවෙන්න කලින්//

සීතල රජයන රෑ යාමේ ......

මහාචාර්ය ෂෙල්ටන් පීරිස්

සිඩ්නි විශ්වවිද්‍යාලය